# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1705/3 – 2011 මැයි 09 වැනි සඳුදා – 2011.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඩීඑස්/වීඑන්/එල්ජී/2007/01.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/05/2006/පීටී/312.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම රජය විසින් අත්කර ගැනීමට ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

උතුරු පළාත යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් උතුර තෙල්ලිපලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලවෙඩ්ඩි ගමේ පිහිටි පිඹුරු අංක පීපීයා 2583 හි ඉඩම් කොටස.

කැබලි අංක 01
ඉඩමේ නම: නරියන් පුලම් පෙරිය පනික්කන් වලවු; විස්තරය: වත්ත; මුල් හිමිකම් කියන අය: පත්මනාදන් සිතම්පරසිවන්, අංක 10, ක්ලිපර් පාර, යෝක් උතුර, ඔන්ටාරියෝ, කැනඩාව; ප්‍රමාණය: හෙක්. 0.0355.

කැබලි අංක 02
ඉඩමේ නම: නරියන් පුලම් පෙරිය පනික්කන් වලවු; විස්තරය: වත්ත; මුල් හිමිකම් කියන අය: සිවසෝති ගුරුනාදපිල්ලෙයි සිවානන්දන්, සෙනෙකා හිල් ඩ්‍රයිව් සයිට්, උතුරු යෝර්ක් ඔන්ටාරියෝ, කැනඩාව; ප්‍රමාණය: හෙක්. 0.0439.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ජූනි මස 24 වැනි දින උදේ 10.00ට තෙල්ලිපලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2011 ජූනි මස 08 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. මුරලිදරන්,
ප්‍රාදේශීය ලේකම්,
තෙල්ලිපළේ.

2011 අප්‍රේල් මස 06 වන දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තෙල්ලිපළේ.

05 - 537

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: කො/ප්‍රාලේ/ඉඅත්/3/70/පීසී.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම රජය විසින් අත්කර ගැනීමට අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ, කොට්ඨාස අංක 27, මාළිගාකන්ද කොට්ඨාසයේ මාළිගාකන්ද ගමෙහි පිහිටි ඉඩම.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කොළඹ 09, ශ්‍රී වජිරඥාණ මාවතේ වරි අංක 167, 171 හා 175; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: රජ් බිල්ඩර්ස් (පුද්) සමාගම, 752, වේල්ස් කුමාර මාවත, කොළඹ - 15; ප්‍රමාණය: හෙක්. 0.0631.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 මැයි මස 25 වැනි දින පූ. හා. 10.00 ට කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 මැයි මස 23 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. ජී. ධර්මතිලක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2011 මැයි මස 06 වන දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කොළඹ.

05 - 538

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.